# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**2131/55 – 2019 ජූලි 12 වැනි සිකුරාදා – 2019.07.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පස්සර කෝරලේ සුළු කොට්ඨාසයේ, මිල්ලබැද්ද (90-ඒ) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මැදවෙල නැගෙනහිර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක BA/ACQ/LNG/2016/256 සහ 2016.12.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – හෝප්ටන් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.4925

උතුරට: රජය හිමිකම් කියන හෝප්ටන් වත්ත, මාර්ගය සහ එම්. යෝගනාදන් හිමිකම් කියන හෝප්ටන් වත්ත; නැගෙනහිරට: එම්. යෝගනාදන් සහ ඩී. එම්. කරුණාරතන හිමිකම් කියන හෝප්ටන් වත්ත; දකුණට: එම්. යෝගනාදන්, ඩී. එම්. කරුණාරත්න හිමිකම් කියන හෝප්ටන් වත්ත සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.), රජය හිමිකම් කියන හෝප්ටන් වත්ත සහ මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2016/PC/205.
2019 මාර්තු මස 16 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 942

1A – G 30513 – 21 (2019/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*